සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම -2014
இரண்டாம் தவணை மதிப்பீடு - 2014
Second Term Evaluation -2014

9 ශ්‍රේණිය தரம் 9 Grade 9	ඉතිහාසය I හා II පත්‍රය வரலாறு வினாத்தாள்-11 History Paper I & II	පැය දෙකයි இரண்டு மணித்தியாலங்கள் Two Hours

II පත්‍රය

◈ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

01. 9 ශ්‍රේණියේ දෙවන වාරයේ ඔබ විසින් කරන ලද "තොරතුරු ගොනුවක් සැකසීම" යන ක්‍රියාකාරකම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i මෙම ක්‍රියාකාරකම සඳහා යොදාගනු ලබන විෂය ඒකකයට ඉතිහාසය පෙළ පොතේ ලබා දී ඇති මාතෘකාව කුමක් ද? (ල. 01)

ii ක්‍රියාකාරකමේ යෙදීමට පෙර විෂයභාර ගුරුතුමා / ගුරුතුමිය ඔබට ලබාදුන් උපදෙස් දෙකක් ලියන්න. (ල. 02)

iii තොරතුරු රැස්කිරීම සඳහා ඔබේ කණ්ඩායමට ලැබුණු මාතෘකාව කුමක් ද? (ල. 01)

iv සෙසු කණ්ඩායම් සඳහා ලබාදුන් මාතෘකාවලින් ඔබ වඩාත් ප්‍රිය කරන මාතෘකා දෙකක් ලියන්න. (ල. 02)

v තොරතුරු ගොනුව නිර්මාණශීලිව ඉදිරිපත් කිරීම සඳහා ඔබේ කණ්ඩායම ඇතුළත් කළ විශේෂාංග දෙකක් ලියන්න. (ල. 02)

vi තොරතුරු ගොනුව සැකසීමේ කාර්යයේ දී වඩාත් හොඳින් නිරත වූ කණ්ඩායමේ සාමාජිකයන් තුළින් ප්‍රදර්ශනය වූ සාධර්ම 2ක් ලියන්න. (ල. 02)

vii (i) ක්‍රියාකාරකමේ යෙදීමේ දී ඔබ මුහුණ දුන් ගැටළු දෙකක් ලියන්න. (ල. 02)

(ii) එම ගැටළු විසඳා ගැනීම සඳහා ඔබ අනුගමනය කළ ක්‍රියාමාර්ග දෙකක් ලියන්න. (ල. 02)

viii ඉගෙනුම් මූලාශ්‍රයක් ලෙස තොරතුරු ගොනුව භාවිත කළ හැකි අවස්ථා දෙකකට උදාහරණ දෙකක් ලියන්න. (ල. 02)

(මුළු ලකුණු 16)

02. i ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවා ගැනීම සිදු වූ අවස්ථා දෙකක් වර්ෂය සමඟ ලියන්න. (ල. 02)

ii බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාව කෙරෙහි සිය අවධානය යොමු කිරීමට බලපෑ කරුණු හතරක් ලියන්න. (ල. 04)

iii බ්‍රිතාන්‍ය ජාතිකයෝ අවස්ථා තුනක දී තුන් ආකාරයකින් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළහ. ඉන් පාලන ක්‍රම දෙකක් නම් කර, එක් පාලන ක්‍රමයක් පිළිබඳ වාක්‍ය තුනක් ලියන්න. (ල. 05)

03. i බ්‍රිතාන්‍යයන්ට උඩරට රාජ්‍යය යටත් කර ගැනීමට අවශ්‍ය වූ හේතු දෙකක් ලියන්න. (ල. 02)

ii i පිළිමතලව්වේ උඩරට රජවීම සඳහා ආධාර ඉල්ලනු ලැබුවේ කුමන ආණ්ඩුකාරවරයාගෙන් ද?

ii කන්ද උඩරට බ්‍රිතාන්‍යයන් සතු කර ගැනීම සඳහා උඩරට රාජ්‍යය සමඟ මිත්‍රශීලී සබඳතාවයක් පැවැත් වූ ආණ්ඩුකාරවරයාගේ නම කුමක් ද?

iii උඩරට රාජ්‍යය හා සමීප සබඳතාවක් පැවැත් වූ සිවිල් සේවයේ නියුතු නිලධාරියාගේ නම ලියන්න?

iv 1812 දී ආණ්ඩුකාරයා ලෙස ශ්‍රී ලංකාවට පත් කර එවනු ලැබූ ආණ්ඩුකාරවරයාගේ නම කුමක් ද? (ල. 04)

iii උඩරට රාජ්‍ය අත්පත් කර ගැනීම සඳහා බ්‍රිතාන්‍යයින් යෙදූ උපක්‍රම දෙකක් සඳහන් කර ඒවා විස්තරයක් කරන්න. (ල. 05)

04. i වර්ෂ 1818 නිදහස් සටනට පසුබිම් වූ හේතු දෙකක් ලියන්න. (ල. 02)

ii එම සටනට දායකත්වය සැපයූ නායකයන් හතර දෙනෙක් නම් කරන්න. (ල. 04)

iii වර්ෂ 1818 නිදහස් සටන අසාර්ථක වීමට බලපෑ කරුණු දෙකක් සඳහන් කර ඒවා පැහැදිලි කරන්න. (ල. 05)

05. i (i) ක්‍රි.ව. 1833 දී මෙරට සිදුවූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හඳුන්වන්නේ කිනම් නමකින් ද?

(ii) එම ප්‍රතිසංස්කරණ වලට අනුව පත්කළ කොමිසමේ සභාපති ධුරය දරූ තැනැත්තාගේ නම ලියන්න. (ල. 02)

ii 1833 දී ක්‍රියාත්මක කළ කොමිසමේ කටයුතු මෙහෙය වනු ලැබූ කොමසාරිස් වරුන්ගේ විශේෂ විමර්ශනයට ලක් වූ අංශ හතර ලියා දක්වන්න. (ල. 04)

iii උඩරට හා පහතරට ප්‍රදේශ ඒකාබද්ධ කොට රට එක් සේසත් කිරීම යන ප්‍රතිසංස්කරණ යටතේ සිදු කළ විශේෂ කාර්යයන් දෙකක් සඳහන් කර ඒවා විස්තර කරන්න. (ල. 05)

06. i බ්‍රිතාන්‍ය අවධියේ මෙරට ක්‍රියාත්මක වූ මිෂනාරි කණ්ඩායම් දෙකක් නම් කරන්න. (ල. 02)

ii 19 වන සියවස අගභාගයේ දී බෞද්ධ පුනර්ජීවනයක් රට තුළ ඇති කරවීම සඳහා ගිහි පැවිදි බෞද්ධයන් අනුගමනය කළ ක්‍රියාමාර්ග හතරක් ලියන්න. (ල. 04)

iii පංචමහා වාද වලින් දෙකක් නම් කර ඉන් එකක් පිළිබඳ විස්තරයක් කරන්න. (ල. 05)

07. i හෙන්රි ස්ටීල් ඕල්කොට්තුමා ලංකාවේ බුදුදහම නගා සිටුවීම සඳහා කරනු ලැබූ සේවාවන් දෙකක් ලියන්න. (ල. 02)

ii 19 වන සියවසේ අග භාගයේ දී ලංකාව තුළ බෞද්ධ ප්‍රබෝධයක් ඇති කිරීමට අනගාරික ධර්මපාල තුමාට සහාය දක්වූ ගිහි පැවිදි බෞද්ධයන් හතර දෙනෙකුගේ නම් ලියන්න. (ල. 04)

iii මහාබෝධි සමාගම මඟින් ආරම්භ කළ පාසල් දෙකක් සඳහන් කර බුදුදහමේ දියුණුවට එම සමාගම දායක වූ ආකාරය විස්තර කරන්න. (ල. 05)

The National e-Learning Portal for The General Education